# සත්ව සන්තතිය සංරක්ෂණය කිරීම

කේ. ඩී. අරුද්ප්‍රගාසම්

ජීව විද්‍යාව පිළිබඳ මහාචාර්ය, කොළඹ විශ්ව විද්‍යාලය.

"ලොව සෑම දෙයක්ම අනෙක් සියළුම දේ හා සම්බන්ධව පවතී." ඇමරිකානු පරිසර විද්‍යාඥ, බැරී කොමනර් පෙන්වාදී ඇති අන්දමට මෙය පරිසර විද්‍යාවේ පළමු නීතියයි. ප්‍රදේශයක සියළුම සතුන් සියළුම ශාක වර්ග හා සියළුම අජීවී වස්තූන් එකිනෙකා හා අන්තර් සම්බන්ධව පවත්නා අතරම, සංතුලිතවූ ගතික අවස්ථාවක පවතී. මේවා සංයුක්තවී පරිසර පද්ධතියක් බිහි කරන අතර, පොකුණු, වගුරු, කැලෑ, තණබිම්, බඳුවූ කුඩා ඒකක මෙන්ම විශාලතම ඒකකය වන මුළු මහත් ජෛවගෝලයද එබඳු වස්තූනට නිදර්ශන වෙයි.

කාර්ය පහසුව තකා සත්ව ලෝකය සංරක්ෂණය අපි වෙන් වෙන් වශයෙන් සාකච්ඡාවට භාජනය කළද, කවර ප්‍රදේශයක වුවද සත්ව සංහතිය, එය අන්තර්ගතව වන්නාවූ පෘථුල පරිසර පද්ධතියෙන් වෙන්කොට ගෙන සලකා බැලිය නොහේ. සත්ව ලෝකයේ වාසභූමිය සංරක්ෂණය නොකරන්නේ නම් සත්ව සංහතියද සංරක්ෂණය කළ නොහැකිවන බව මෙයින් අදහස් වේ. ප්‍රදේශයක සත්ව සංහතිය සංරක්ෂණය කරනු වස් විවිධ කාර්ය බද්ධ පරිසර පද්ධතීන් සමූහයක් ස්වාභාවික ස්වරූපයෙන්ම පවත්වා ගැනීම අවශ්‍ය වනු ඇත.

බොහෝ අවස්ථාවලදී ශ්‍රී ලංකාව බඳු රටවල සංරක්ෂණය පිළිබඳ අදහස් සංකේන්ද්‍රණය වනුයේ අභාවයට පත්වීමේ බියට මුහුණපා ඇති ක්ෂීරපායී හා කුරුළු ගණයේ සතුන් සහ කොඳු ඇටය සහිත වෙනත් සත්ව වර්ගද කෙරෙහි වේ. බොහෝ අය මෙබඳු සත්ව වර්ග දන්නා හඳුනන අතර, ස්වාභාවික පරිසරයේදී ඔවුන් නිරීක්ෂණය කිරීම ජනප්‍රිය විනෝදාංශයක් බවට පත්ව ඇත. එසේ වුවද, සත්ව සංහතිය සංරක්ෂණයෙහි ප්‍රධාන ගැටළු මීට අතිශයින් වෙනස් වේ. අද ලෝකයේ ජීවීන් වර්ග දෙලක්ෂයක් පමණ වෙසෙති. මෙම ග්‍රහලෝකය මත ජීවයේ පැවැත්ම සඳහා මෙම සියළුම වර්ග අත්‍යාවශ්‍ය නොවේ. මෙම ඇතැම් ජීවීන් මිනිසාට අහිතකරද වේ. එසේ වුවද, අපට අවශ්‍ය හා අවශ්‍ය නොවන වර්ග කවරේදැයි අපි නිශ්චිතව නොදනිමු. එමෙන්ම අනාගත පරිණාම ක්‍රියාවලිය සඳහා මෙම වර්ගයන් අන්තර්ගත කවර ජාන්ම ප්‍රවේණියකද යන්න පවා අපි නොදනිමු. එබැවින්, විවිධ ස්වාභාවික වාසභූමිවල ආවේණිකව පවත්නා විශේෂ සත්ව සමූහයන්හි අඛණ්ඩ පැවැත්ම පිළිබඳව වගබලාගත යුතුව ඇත.

කොඳුඇට රහිත අප්‍රධාන සත්ව වර්ග සවභාව ධර්ම ක්‍රියාවලියෙහි ඉටු කරන කාර්යභාරය මෙහිලා පැහැදිළි කලයුතුය. ගැඩවිල්ලාගෙන් ජීවි ලෝකයට සිදුවන මහඟු සේවය බොහෝ අය නොදනිති. "ලෝක ඉතිහාසයෙහි එතරම් වැදගත් සේවයක් ඉටු කල වෙනත් සත්ව වර්ගයක් ඇතිදැයි යන්න පවා සැක සහිතයයි" චාල්ස් ඩාවින් පැවසුයේ එබැවිනි. පසෙහි ගුල්තුල වෙසෙන ගැඩවිලුන් දිරාපත්වූ ශාක ද්‍රව්‍ය ආහාර වශයෙන් ගනිති. පෝෂණයේදී හා ගුල් කැනීමේදී උන් පස් ගිල දමන අතර මේවා කෝෂ වශයෙන් ශරීරයෙන් පිටකරනු ලැබේ. අක්කරයක එක් දිනකට කෝෂ ටොන් 10 කට අධික සංඛ්‍යාවක් තිබියහැකි අතර, මේවා සාමාන්‍ය පසට වඩා සාරවත්ය. එපමණක්ද නොව උන් මෙසේ පස හැරීමේදී පසට වාතය හා ජලය වඩාත් පහසු ලෙස උරාගත හැකිවනු ඇත.

ගැඩවිලුන් සංරක්ෂණය කිරීමෙහි වැදගත්කම සුළුකොට තැකිය නොහේ. ගොම කුරුමිණියා සත්ව ලෝකයේ ක්ෂුද්‍ර අංශුවක වැදගත් ලෙස සැලකිය හැකි තවත් නිදසුනකි. ගොම කුරුමිණියා සහ පැටවුන්ද ගොම පෝෂණය කොට ගනිති. මෙම ක්‍රියාවලිය හේතුකොටගෙන ගොම පස හා සංකලනය වී පස වඩාත් සාරවත් වේ. ඕස්ට්‍රෙලියාවේ කුරුමිණි වර්ග කැන්ගරු කසල ආහාර පිණිස ගනිති. උන් ගොම නොබුදින බැවින්, ඒවා අවුරුදු ගණනාවක් තිස්සේ පොළව මතුපිට වසා පවතින බැවින් එහි කිසිවක් රෝපණය කළ නොහැකිවනු ඇත. එබැවින් මෙම ගැටළුව නිරාකරණය කරගනු වස් ඕස්ට්‍රෙලියාවේ ගොම කුරුමිණියන් බෝකිරීම ආරම්භ කර ඇත.

සත්ව සංරක්ෂණයෙහි මුහුණුවර දෙකක් ඇති බව මෙයින් පෙනී යනු ඇත. පළමුවැන්න ඌණ වැදගත් කමකින් යුත් කරුණ වන වඩා විශාල සත්ව වර්ග, විශේෂයෙන් කොඳු ඇටය සහිත සත්ව වර්ග ආරක්ෂා කර ගැනීමයි. දෙවැන්න සමස්තයක් වශයෙන් ඒ ඒ ප්‍රදේශවල සත්ව මණ්ඩල සංරක්ෂණය කිරීමේ වඩාත් මූළික වූ කාර්යයි. එහෙත් අභාග්‍යයකට මෙන් දෙවනුව සඳහන් අංශයට යොමුකර ඇත්තේ පළමු අංශයට වඩා අඩු අවධානයක්, ප්‍රචාරණයක් හා මුදල් ප්‍රමාණයකි.

සත්ව පරිනාමික පුවත් අනුව, වඳවූ සත්ව විශේෂ දශ ලක්ෂ ගණනාවක ඇටකටු පාෂාණී භූතව ඇත. මොවුහු අතීතයේ කලකදී ඇතිවී කාලසීමාවකට පසු අභාවයට පත් සත්ව වර්ග වෙති. උද්ගතවීම, පැවැත්ම, ව්‍යාප්තිය හා අවසානයේදී වඳවීම, ජෛව ලෝකයේ සමෝධානාත්මක අංශයක් වන චක්‍රිය ස්වභාවයකි.

වසර දශ ලක්ෂ ගණනාවක් ඔස්සේ ලොව පුරා සැරිසැරූ ඩිනසෝර් නම් සත්ව වර්ගයා අවුරුදු දශ ලක්ෂ 70 කට පමණ ඉහතදී අභාවයට පත්විය. ක්ෂීරපායී සත්ව වර්ගය ව්‍යාප්තියේ මුඛ්‍ය අවස්ථාව ඉක්මවා ඇතැයි පවසති. මිනිස් පහසින් තොරව, වූලිමැමත් හා ග්‍රවින්ඩ් ස්ලොත් යන සත්ව වර්ග වඳවී ඇත. ස්වභාව ධර්මයාගේ ක්‍රියාවලියෙහි නිත්‍යතාව අපට නොවැළැක්විය හැකි වුවද, පක්ෂි හා ක්ෂීරපායී සත්ව විශේෂ අභාවයට පත් කරලීම සඳහා මිනිසා කොතරම් දුරට වගකිවයුතුද යන්න සිත් මවිත කරවන සුළුය. පසුගිය වසර තුන්සියය ඇතුලත මිනිසා විසින් සත්ව වර්ග 200 ක් පමණ වඳකොට ඇතැයි ඇස්තමේන්තු කර ඇත. මෙම සියවස ඇතුලත මෙම විනාශය වඩාත් සීඝ්‍රයෙන් සිදුවී ඇති අතර, සෑම අවුරුද්දකදීම ලොව කවර තැනක හෝ එක් සත්ව වර්ගයක් අභාවයට පත්වන බව විශ්වාස කරනු ලැබේ. සමස්තයක් වශයෙන් බලන කළ මෙසේ අභාවයට පත් සත්ව වර්ග වලින් වැඩි සංඛ්‍යාවක් එසේ වඳවීම ලොව ජෛවීය පැවැත්ම කෙරෙහි බල නොපාන නමුදු, එය මනුෂ්‍ය වර්ගයාට පාඩුවක් වන බවට සැකයක් නැත.

අභාවයට පත්ව ඇති හෝ අභාවයට පත්වෙමින් ඇති සත්ව වර්ග සම්බන්ධයෙන් බලනකල අනිසි විපාක නොදැනීම, මුලදී හේතු වුවද ද්‍රව්‍යමය වාසි සඳහා මිනිසා තුල ඇති තෘෂ්ණාව මෑතකදී ඊට සහේතුක වී ඇති බව පෙනේ.

1. උත්තරධ්‍රැව ප්‍රදේශයේ වෙසෙන ලොම් සහිත සීල් වර්ගයා බෙරිං මුහුදේ ප්‍රිබිලෝෆ් දිවයිනේ වෙසෙති. 1786 දී

දශලක්ෂ ගණනාවකින් යුතු සීල් රංචු මෙහි දක්නා ලදී. අවුරුදු 20 ක් මුළුල්ලේ කිසි ඉවක් බවක් නොමැතිව මොවුන් ඝාතනය කිරීම නිසා මොවුන් දුන් අභාවයට පත්ව යමින් පවතී. අනතුරුව මේ පිළිබඳව රෙගුලාසි පනවනු ලැබුවද, 1911 වන විට සංඛ්‍යාව 125,000 දක්වා පහත වැටී ඇත. යළිත් සංරක්ෂණ ක්‍රියා මාර්ග ඇන්තුකොටගෙන මෙම සත්ව වර්ගයා අභාවයට පත්වීමට ඉඩ නොදී බේරාගනු ලැබූයෙන් 1958 වන විට සීමිත ඝාතනයට ඉඩදී තිබියදී පවා සත්ව සංඛ්‍යාව විසි ලක්ෂය පමණ දක්වා ඉහළ නැග ඇත.

2. අඩි 100 ක් පමණ දිගැති ටොන් 160 ක් පමණ බරවූ බ්ලූ වේල් නමින් හැඳින්වෙන තල්මස් වර්ගයා ලොව විසූ විශාල තම සත්ව වර්ගයා වේ. වෙළඳ ව්‍යාපාර උදෙසා තල්මසුන් මැරීමේ නියුතු ජපන්, නෝර්වේ සහ රුසියානු ජාතිකයෝ මෙම විස්මයජනක සත්ව විශේෂය වඳවී යාමට හේතුවී ඇත. 1950 හිදී මෙම වර්ගයේ තල්මසුන් 5231 ක් මරන ලද අතර 1967 හිදී එකද තල්මසකු හසුවී නැත. වෙනත් වර්ග වල තල්මසුන්ගේ සංඛ්‍යාවද බෙහෙවින් අඩුවී ඇත.

විවිධ සත්ව විශේෂ වර්ග වඳවූ හෝ වඳ වෙමින් පවත්නා අවස්ථා බොහොමයක් ඇතත්, ජාතීන් කිහිපයක්ම ඵලදායී ක්‍රියා මාර්ග අනුගමනය කොට ඇත. දැඩි සංරක්ෂණ ක්‍රියා මාර්ග පනවා ඇති රටවල් සම්බන්ධයෙන්, ඕස්ට්‍රේලියාව හා නවසීලන්තය කදිම නිදසුන්ය. ලොව සෙසු රටවලින් මැන්ව පිහිටි ඕස්ට්‍රේලියා මහද්වීපය අසහාය සත්ව සංහතියකට හිමිකම් කියයි. එහි සියළුම ක්ෂීරපායී වර්ග – චර්ම කෝෂ ක්ෂීරපායී ගණයට අයත් වෙති. වෙනත් රටවල බීජබන්ධන ක්ෂීරපායී සතුන් විසින් ඉටු කරනු ලබන කාර්යයන් ඕස්ට්‍රේලියානු පරිසර පද්ධතීන්හි චර්ම කෝෂ ක්ෂීරපායී වර්ගයේ සතුන් විසින් ඉටුකරනු ලැබේ. තදබල සංරක්ෂණ ක්‍රියාමාර්ග හා ආරක්ෂිත ක්‍රියාමාර්ග අනුගමනය කිරීමෙන් මෙම අසහාය සත්ව වර්ගය සුරක්ෂිතව ඇත.

ඕස්ට්‍රේලියාව, නවසීලන්තය හා මැඩගස්කර් යන රටවල සත්ව සංහතිය හා සමාන කරනවිට ශ්‍රී ලංකාවේ සත්ව සංහතිය එතරම් අතිවිශේෂ වූවක් නොවේ. මයෝසීන යුගයේ අවසාන අවධියේදී ඉන්දීය අර්ධද්වීපයෙන් වෙන් වූ ශ්‍රී ලංකාද්වීපය ඉන්දීය අර්ධද්වීපයේ නිරිතදිග දෙසින් ප්‍රථමයෙන් වෙන්වූ කොටස ලෙස සැලකේ. එබැවින් ශ්‍රී ලංකාවේ සත්ව සංහතිය ඉන්දියාවේ සත්ව සංහතිය හා බෙහෙවින් සමානානුරූප වේ. වියළි කලාපීය සත්ව ගණ සම්බන්ධයෙන් මෙය විශේෂයෙන්ම අදාල වේ. කඳුකර තෙත්කලාපීය සත්ව සංහතිය වඩා විශේෂ ලක්ෂණ වලින් යුතු වුවද එය මැලේසියානු කඳුරු මගෙහි සත්ව සංහතියට සමාන වේ.

ශ්‍රී ලංකා සත්ව සංහතියෙහි කොඳු ඇටය සහිත සත්ව විශේෂ 628 ක් පමණ ඇති අතර, ක්ෂීරපායී ගණයට අයත් සත්ව වර්ග 84 ක් පක්ෂීන් වර්ග 379 ක්, උරග වර්ග 133 ක් හා උභයජීවී වර්ග 32 ක් මෙහි අන්තර්ගත වේ. ලංකාවේ ක්ෂීරපායී සත්වයන් පිළිබඳ ලේඛනයක් සකස්කළ අයිසන්බර්ග් හා මැකේ (1970) පහත සඳහන් සතුන් ඒකදේශික වශයෙන් දක්වා ඇත.

කඳුකර කලාපයට සීමාවූ වර්ග:—

| | | |
|---|---|---|
| ලී වර්ග | — | ෆේපෙරොකියුලස් ෆේපොරොකියුලස්, සොලිසොරෙක්ස් පෙයර්සෝනි, ක්‍රොසිඩියුරාෆ්මියා. |
| මූෂික | — | රැටස් මොන්ටානස්, රැටස් ඔහියෙන්සිස්, |

සැ.යු.:— ෆේපෙරොකියුලස් සහ සොලිසොරෙක්ස් යනු ඒක දේශික ගණ වෙති.

දිවයින පුරා දක්නට ඇති ඒකදේශික වර්ග:—

| | | |
|---|---|---|
| වානර | — | ප්‍රෙස්බිටිස් සෙනෙක්ස් |
| මාංශභක්ෂක | — | පැරඩොක්සියුරස් සෙලනික්ස් |
| මූෂික | — | මුස් ෆර්නැන්ඩොනි, මුස් මෙයොරි |

දිවයින පුරා ක්ෂීරපායී සත්ව ව්‍යාප්තිය අධ්‍යයනය කිරීමේදී අයිසන්බර්ග් හා මැකේ (1970) විසින්, මුවලර්-ඩොම්බොයි හා සිරිසේන (1967) සහ වෙනත් කතෘවරුන් ගෙනහැර දැක්වූ වෘක්ෂ ලතා කලාප හත උපයෝගී කරගෙන ඇත.

| | | |
|---|---|---|
| මෝසම් ලඳු කැලෑ | — | උතුරු හා වයඹ |
| | — | ගිණිකොන |
| මෝසම් වනාන්තර හා තණබිම් අත්තර | | |
| මෝසම් වනාන්තර වර්ෂා වනාන්තර | | |
| හා තණබිම් | — | අඩි 3000 ට පහළ |
| | | අඩි 3000 ට ඉහළ |
| | | අඩි 5000 ට ඉහළ |

ශ්‍රී ලංකාවේ ඒක දේශික සත්ව වර්ග වලින් වැඩි කොටසක් වර්ෂා වනාන්තර වලට සීමාවන අතර 25% ක් පමණ අඩි 5000 ට ඉහළ ප්‍රදේශවල වෙසෙති. ශ්‍රී ලංකාවේ ක්ෂීරපායී අනුවර්ග වලට අයත් සත්ව විශේෂ පිළිබඳ තත්වය අවිනිශ්චිත යයි අයිසන්බර්ග් හා මැකේ දක්වා ඇත. මෙම අනුවර්ග විශේෂ කොට දක්වා ඇති විශේෂාංග බොහොමයක් පදනම්වන වෙනස්කම් වලට හේතු සාධක වනුයේ කඳුකර තෙත් කලාපයේ සිට පහතරට මෝසම් වර්ෂා වනාන්තර දක්වා ඇතිවන ආතතිය වෙනස්කම් බව ඔවුහු ගෙනහැර දක්වති. මෙම වර්ග තවදුරටත් අධ්‍යයනය කළහොත්, අනු වර්ග ලෙස දැන් හැඳින්වෙන සත්ව විශේෂ කිහිපයක්ම විශේෂ වර්ග වශයෙන් දැක්විය නොහැකි යයි ඔවුහු පවසා ඇත.

දකුණු ඉන්දීය සත්ව සංහතිය හා සමාන කර බැලීමේදී මෙරට සත්ව සංහතිය විවිධත්වයෙන් අඩුය. එසේ වුවද, ප්ලෙයිස්ටෝසීන අවධියෙහිදී මෙය වඩා විවිධත්වයෙන් යුතුවිය. පාෂාණීභූත සාධක අනුව දිවයිනෙහි හෙක්සප්‍රොටඩෝන හිපපොටමසකු, රයිනොසිරස් ගණයේ වර්ග දෙකක්, පැන්තිරාලියෝ නම් ඉන්දියානු සිංහයා, කුඹොන් ජාවානිකස් නම් රතු බල්ලා, කැලෑ හරකා බඳුවූ සත්ව විශේෂ මෙහිවූ බව පෙනේ. සත්ව සංහතියක විවිධත්වය, වාසභූමියේ ප්‍රමාණය මත රඳාපවතින බව පිළිගත් මූලධර්මයකි. දිවයිනෙහි වූ ක්ෂීරපායී ගණයේ විශාල සතුනට ස්වාභාවික තත්ව යටතේ මෙහි පැවතීමට නොහැකිවී ඇත. අද ඉතිරිව ඇත්තේ භෞතික වර්ග අතුරින්, **එලිෆස් මැක්සිමස්, මෙලර්සස් අර්සිනස්, ඇක්සිස් ඇක්සිස්, සර්වුස් යුනිකලර්, බුබාලස් බුබාලිස්, සුස් ස්ක්‍රෝෆා** සහ ජලජ සතුන් අතරින් ඩූගොං ඩූගොං ඇතුළු වර්ග කිහිපයක් පමණකි. සමස්ථයක් වශයෙන් ගත්කල මොවුන්ගෙන් අපගේ විශේෂ ක්ෂීරපායී සත්ව සමූහය නිරූපණය නොවන නමුදු, මෙරට දැනට මොවුන් පමණක් ශේෂවී පවත්නා බැවින් ඔවුන්ගේ පැවැත්ම ආරක්ෂා කර ගැනීම වැදගත් කාර්යයකි.

ශිෂ්ටාචාරයට පෙර අවධීන්හි මිනිසා සත්ව සංහතියේ එක් ඒකකයක් පමණක් විය. පරිසරය කෙරෙහි ඔහුගේ බලපෑම, වෙනත් සත්ව විශේෂයන්හි බලපෑමට සමානවිය. ශිෂ්ටාචාරය දියුණුවී, කෘෂිකර්මය, කර්මාන්ත හා නාගරීකරණය වර්ධනය වීමත් සමගම මිනිසා, මිනිසාට මෙන් සෙසු සත්වලෝකයාටද අහිතකරවන අන්දමට සීඝ්‍රයෙන් පරිසරය විනාශකර දමන්නාවූ ව්‍යසනගත රෝගයක් බවට පත්ව ඇත. අපරට ජනගහනය, සිය පරිසරයට දරිය නොහැකි තරමට වර්ධනයවී ඇති අතර එය තව තවත් වැඩෙමින් පවතී.

වැඩිවන ජනගහනය පෝෂණය කිරීම උදෙසා දැවැන්ත කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපෘති හා සුවිසල් කාර්මික සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කරවිය යුතුය. මෙයින් ස්වාභාවික පරිසරය කෙරෙහි බලපෑම් ඇති කෙරේ. ස්වාභාවික වෘක්ෂලතාදිය සහ ඉන් යැපෙන්නාවූ සත්ව සමූහයාද කෘෂිකාර්මික නිෂ්පාදනයට තැනදී අභාවයට පත්වෙති. මිරිදිය, කිවුල් ජලය හා මුහුදු ජලයද නොයෙකුත් අපවිත්‍ර දූයින් කෙලසේ. එපමණක්ද නොව ජන සංඛ්‍යාව වැඩිවීමත් ඔවුන් වැඩි භූමි ප්‍රදේශයක් අත්පත් කරගැනීමත් සමග, දැනටමත් ක්ෂය වෙමින් පවතින සත්ව සන්තතිය කෙරෙහි බෙහෙවින් විනාශකාරී බලපෑම් ඇති කරනු ඇත.

ලංකාවේ අලින් හා ඔවුන් ආරක්ෂා කරගැනීම පිළිබඳව මෑතකදී අවධානයට ලක්වී ඇත. අනුචිත ලෙස ස්වාභාවික පරිසරය එළිපෙහෙළි කිරීමෙන් අගනා ජාතික සම්පත් වලට සිදුවන දුර්විපාක දැක්වීම සඳහා මෙය කදිම නිදසුනකි. දිවයිනේ නිරිත දිග හා මධ්‍යම ප්‍රදේශ බඳු කොළ ආහාර හා ජලය අපමණ ප්‍රදේශවල අලි ඇතුන් වෙසෙති. එසේ වුවද දැන් මොවුන් වියළි වූ හා අයෝග්‍ය ලක්ෂණ සහිත ප්‍රදේශවලට පළවා හැර ඇත. පෝෂණ හා සංක්‍රමණික කාර්යයන් සඳහා ඔවුන්ට ඉමහත් ප්‍රදේශයක් අවශ්‍ය වේ. අලින් බෝවීම ඉතා සෙමින් සිදුවන්නක් වන අතර ඔවුන්ගේ ගැබ් දැරීමේ කාලසීමාව මාස 22 කි. අල්ලාගත් අලි පැටවුන් බෝ කරනුයේ ඉතාමත් කලාතුරකිනි. ලංකාවේ අලින්ගේ අනාගතය අඳුරු ලෙස පෙනෙන අතර සීඝ්‍රයෙන් වඳවීගෙන යන අලි පරපුර පරිසර විද්‍යාත්මක වශයෙන් ඉතා වැදගත් සත්ව සංකීර්ණයක අභාවයේ සංකේතයකි.

සත්ව සංරක්ෂණ පිළිබඳ සමස්ත ගැටළු අප කෙසේ නිරාකරණය කර ගමුද? සංවර්ධන කටයුතු තාවකාලිකව කළ නොහැක්කකි. එමෙන්ම සත්ව සංරක්ෂණය යන්නෙන් සම්පූර්ණ පරිසර පද්ධතීන් ආරක්ෂා කර ගැනීම අදහස් කෙරේ. මානාව සැලසුම් කළ සමෝධානාත්මක වැඩසටහන් වහා අවශ්‍යවී ඇත. එබඳු වැඩසටහනක අන්තර්ගත වියයුතු කරුණු පහතින් දැක්වේ.

1. මුළු රටෙහි ස්වාභාවික පරිසර පද්ධතීන් ප්‍රලේඛනය – මෙය පදනම්කොට ස්වාභාවික ස්වරූපයෙන් පවත්වාගත යුතු ප්‍රදේශ වෙන්කළ යුතුය. මෙහි වනාන්තර පමණක් නොව තණබිම්, කඩොලාන, වගුරුබිම්, මුහුදුතීරය, යනාදියද ඇතුලත් වේ. කඳුකර වනාන්තර හා සිංහරාජය බඳු වනාන්තරවලට අත නොතැබිය යුතුය.

2. ජාතික වනෝද්‍යාන, දැඩි ආරක්ෂිත ප්‍රදේශ සහ අතරමැදි කලාප ලකුණු කිරීම පමණක් ප්‍රමාණවත් නොවේ. මෙම ප්‍රදේශවල පරිපූර්ණ පරිසර විද්‍යාත්මක අධ්‍යයන පැවැත්විය යුතුය. එබඳු අධ්‍යයනයන් හිදී එක්රැස්කරගත් තොරතුරු මෙම වනෝද්‍යාන පාලනය කිරීමෙහිදී උපයෝගී කරගත යුතුය. ස්වාභාවික පරිසරය කෙමෙන් සංකෝචනය වන බැවින්, මේවා පාලනය කිරීම අතිශයින් වැදගත් කාර්යයක් බවට පත්ව ඇත. අතිසීමිත සම්පත් හා සේවක පිරිස් ඇතත්, වනසත්වාරක්ෂක දෙපාර්තමේන්තුව අති දුෂ්කර කාර්යයක් ඉටු කරයි. දෙපාර්තමේන්තුවේ පුහුණු විද්‍යාත්මක සේවක සංඛ්‍යාව කිහිප වාරයකින්ම වැඩි කිරීම අත්‍යාවශ්‍යය. අපගේ වන සත්ව ජීවිතය හා වනෝද්‍යාන පිළිබඳ මූලික තොරතුරු ආගන්තුක විද්‍යාඥයන්ගෙන් ලැබ ගැනීමට සිදුවීම ආඩම්බරවීමට හේතුවන කරුණක් නොවන අතර මෙම අඩුපාඩුවට පිළියම් වශයෙන් අප විසින් පියවර කිහිපයක් ගෙන ඇත. යාල වනෝද්‍යානයේ ගැටළු කිහිපයක් අධ්‍යයනය කිරීම සඳහා ඇබර්ඩීන් විශ්ව විද්‍යාලය, කොළඹ විශ්ව විද්‍යාලය හා වන සත්වාරක්ෂක දෙපාර්තමේන්තුවේ විද්‍යාඥයන් විසින් ඒකාබද්ධ පරිශ්‍රමයක් දරන ලදී.

මෙම වසරේදීද මෙබඳු අධ්‍යයනයක් පැවැත්වීමට අදහස් කර ඇති අතර, අපගේ වනෝද්‍යාන නිසිලෙස පාලනය කිරීම සඳහා අවශ්‍ය මූලික අවශ්‍යතාවයක් වන පරිසර විද්‍යාත්මක අධ්‍යයනය සඳහා ජාතික විද්‍යා සභාවේ අනුග්‍රහය ලැබෙයයි පතමු.

3. වඩාත් විශාල ක්ෂීරපායී සතුන්ගේ හැසිරීම, සංක්‍රමණයන්, ගැටළු සුපරීක්ෂාකාරීව අවලෝකනය කළ යුතුය. මෑතකදී මහවැලි සංවර්ධන ප්‍රදේශයේ අලිරංචුවක් නව ප්‍රදේශයකට පලවා හරින ලදී. විද්‍යාත්මක පදනමක් අනුව මෙම සතුන්ගේ අවශ්‍යතා සුපරීක්ෂාකාරීව අන්වීක්ෂය කළයුතු වේ. මේ සඳහා වනසත්වාරක්ෂක දෙපාර්තමේන්තුවට අතිරේක සේවක පිරිස් හා පහසුකම් සැපයිය යුතුවන අතරම, කැලෑ හා සම්බන්ධ අපේ සියළුම දෙපාර්තමේන්තු හා ආයතනවල සහයෝගයද ඊට සලසා දිය යුතුය.

4. කැලෑ හා සත්ව සංහතියට අදාලවූ රෙගුලාසි දැඩිලෙස ක්‍රියාත්මක කළ යුතුවන අතර මේවා සාර්ථකව ක්‍රියාත්මක නොවන තැන්හි වඩා සියුම්ව සංවිධානය කළ යුතුය.

5. සීමාවක් නොමැතිව විදේශීය රටවලට සතුන් අපනයනය කිරීම හේතුකොටගෙන අප රට ස්වාභාවික සත්ව ජීවිතය කෙරෙහි සිදුවී ඇති බලපෑම් පිළිබඳ පෘථුල ඇගයුමක් කරන තෙක් සතුන් පිටරටවලට අපනයනය කිරීම මුළුමනින්ම තහනම් කළ යුතුය. 'ඒකදේශික' හා වඳවීමේ තර්ජනයට මුහුණ පා ඇති සත්ව වර්ග පමණක් ඝාතනය කිරීම හෝ රටින් ඉවතට ගෙනයාම තහනම් කිරීම ප්‍රමාණවත් නොවනු ඇත.

6. අනාගත සංවර්ධන වැඩසටහන් වල ප්‍රාරම්භක සැළසුම් කාර්යාවලියේ කොටසක් වශයෙන් පරිසර පද්ධතීන් ආරක්ෂා කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සැලසිය යුතුය. ස්ථාවර විද්‍යාත්මක තොරතුරු පදනම්කොට, පරිසර සංරක්ෂණය සැලසුම් හා සම්බන්ධී තීරණ ගැනීමද කළයුතු බව අවධාරණය කළ යුතුව ඇත. එබඳු තොරතුරු එක්රැස් කිරීම කළහැකි දෙපාර්තමේන්තු හා ආයතන මෙහිලා උත්සුක විය යුතුය. පුහුණුව ලත් විද්‍යාත්මක නිලධාරීන් එබඳු දෙපාර්තමේන්තුවල සේවක සංඛ්‍යාවෙහි අන්තර්ගත කළ යුතුය. ස්වාභාවික පරිසරය සංකෝචනය වීමත් සමගම මෙය වැදගත් කාර්යයක් බවට පත්වෙනු ඇත. ස්වාභාවික පරිසරය සුපරීක්ෂාකාරීව පෝෂ්‍ය කළයුතු ජාතික උරුමයක් ලෙස සලකමු.